# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097
ලේකම් / செயலாளர் / Secretary: 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-2213097
ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082


මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/15-18/TO/බදවා ගැනීම 2021(2025)
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2025.12.17.

මධ්‍යම පළාතේ, ප්‍රධාන ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම් දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/විදුලි/යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණි සඳහා පත්කරන ලද නිලධාරීන් සඳහා ජීවන වියදම් දීමනාව ගෙවීම, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සහ නිවාඩු සම්බන්ධයෙනි.</u>**

මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/විදුලි/යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණි සඳහා පත්කරන ලද නිලධාරීන් සඳහා ජීවන වියදම් දීමනාව ගෙවීම, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සහ නිවාඩු සම්බන්ධයෙන් එම නිලධාරීන් සේවයේ නියුතු ආයතන මගින් නිරන්තරයෙන් මෙම කොමිෂන් සභාව වෙතින් විමසීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.

02. පුහුණු ශ්‍රේණිවල නිලධාරීන්ගේ ජීවන වියදම් දීමනාව ගෙවීම හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීම සම්බන්ධව සියලු ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සම්බන්ධයෙන් වන පොදු ලිපියක් මාගේ අංක CPC/PSC/15-18/පොදු ගොණුව/2019 හා 2020.02.10 දිනැතිව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බව අවධානයට යොමු කරමි.

03. ඒ අනුව, එකී ලිපියේ සඳහන් පරිදි අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහාත්, මේ වන විට වැටුප් ගෙවීම සම්බන්ධව කටයුතු කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන ප්‍රකාරව දීමනා ගෙවීම සම්බන්ධවත්, ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 32 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිවාඩු සම්බන්ධව කටයුතු සිදු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04. එමෙන්ම, මෙම ලිපියේ පිටපතක් සහ මාගේ අංක CPC/PSC/15-18/පොදු ගොණුව/2019 හා 2020.02.10 දරණ ලිපියේ පිටපත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **<u>www.psc.cp.gov.lk</u>** හි පළකර ඇත.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත


යහපාලනය කෙරෙහි සාධනීය අයුරින් සහාය වන්නාවූ පළාත් රාජ්‍ය සේවයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශක්තිමත් අත්වැලක් සැපයීම
நல்லாட்சிக்கு உறுதுணையாக அமையும் வகையில் மாகாண அரச சேவையை மேம்படுத்தும் உந்துசக்தியாக திகழுதல்
Provision of potential support for the progress of Provincial Public Service, which positively assists for the salutary governance

මධ්‍යම පළාත් ස[illegible]රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபை[illegible] அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

කාර්යාලය / காரியாலயம் / Office - 081-2213097
ලේකම් / செயலாளர் / Secretary - 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary - 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax - 081-2213096, 081-2213082


මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/15-18/පොදු ගොනුව/2019
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2020.02 . 18

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
මධ්‍යම පළාත.

**<u>මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) පුහුණු ශ්‍රේණියේ තනතුරුධාරීන්ට</u>**

**<u>විශ්‍රාම වැටුප් හිමිකම</u>**

2013.12.31 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/2013 යටතේ රජය විසින් 2014 අයවැය යෝජනා මඟින් ප්‍රකාශිත ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ආකාරයත්, 2019.04.22 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019 යටතේ රජය විසින් 2019 අයවැය යෝජනා අනුව සියළුම රාජ්‍ය නිලධරයින් සඳහා 2019.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනයට අදාළ කර නොගන්නා රු.2,500ක මාසික අන්තර් දීමනාවක් ගෙවීමට කටයුතු කළ යුතු බව දන්වා ඇත.

02. මධ්‍යම පළාත් සභාවේ තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව අධ්‍යාපන සුදුසුකම් පදනම් කරගෙන විවෘත බඳවා ගැනීම් තුළින් පුහුණු ශ්‍රේණියට හා III ශ්‍රේණියට තාක්ෂණ නිලධාරීන් බඳවා ගනු ලබන අතර, මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ පුහුණු තනතුර සඳහා පත්වීම් ලබා දී වසරක හෝ දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වන යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම මත එම නිලධාරීන් මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) III ශ්‍රේණියේ තනතුරට පත් කරන අතර, පුහුණු කාලය තුළ වැටුප් චක්‍රලේඛ 03/2016හි V උපලේඛනයේ I වගුවේ සඳහන් පරිදි මාසික දීමනාව හා ගැලපුම් දීමනාව සඳහා හිමිකම් ලබනු ඇත.

03. පුහුණු කාලය තුළදී මොවුනට 2016.01.01 දිනෙන් පසු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි [illegible]වන පරිශිෂ්ඨය ප්‍රකාරව දීමනාව හා ගැලපුම් දීමනාව ගෙවන ලද අතර 2015.12.31 දිනට පෙර පත්වීම් [illegible]ැබූවන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(II) අනුව පහත පරිදි දීමනා ගෙවනු ලැබේ.

1 වසර - රු.12,920/-
2 වසර - රු.13,040/-

04. ඒ අනුව, තාක්ෂණ සේවයේ පුහුණු තනතුර සඳහා බඳවා ගන්නා නිලධාරීන්ට අංක 37/2013 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් පරිදි ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධව උපදෙස් ලබා දෙන ලෙස මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂගේ අංක සීපීසී/සීඑස්/11/1/03 හා 2019.08.28 දිනැති ලිපිය මඟින් විමසීම සිදුකර ඇත.

05. එබැවින්, තාක්ෂණ සේවයේ පුහුණු තනතුර සඳහා බඳවා ගත් නිලධරයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/2013 අනුව ජීවන වියදම් දීමනාව ගෙවීමත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019 අනුව අන්තර් දීමනාව ගෙවීමත් සම්බන්ධව සීපීසී/පීඑස්සී/15-18/පොදු ගොනුව/2019 හා 2019.09.23 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසීම් කරන ලදී.

06. එයට අදාලව එවන ලද අංක EST 5/4/24(XXIV)-5 හා 2019.10.24 දින දරණ ලිපියෙන් ලද උපදෙස් අනුව පහත පරිදි දැක්වේ.

"රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019 අනුව රජයේ නිලධරයා යන්නට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි උපලේඛන Vහි සඳහා ආධුනික සහ පුහුණුලාභී තනතුරුවල නිරත නිලධරයන් අයත් නොවන බව දන්වා ඇත. තවද පුහුණු ශ්‍රේණියට බඳවාගෙන ඇති කාර්මික නිලධාරීන්ගේ පුහුණුවීම් කාලය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ගණනීය සේවා කාලයක් ලෙස සලකන්නේ නම් පමණක් එම නිලධරයන් සඳහා ජීවන වියදම් දීමනාව ගෙවීම සුදුසු බව දන්වා ඇත."

07. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019හි නිර්වචනය අනුව පුහුණු සේවකයින් රාජ්‍ය නිලධාරීන් ලෙස සලකා නැති බැවින්ද, මෙම පුහුණු සේවකයින් රාජ්‍ය සේවයේ පත්වීම් ලබා වැටුප් ලබන සේවා පිරිසක් බැවින්ද මොවුන්ගේ පුහුණු සේවා කාලය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ගණනීය සේවා කාලයක් ලෙස සැලකිය හැකිද යන්නත්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයකට අයත් නොවන වෙනත් සේවා කාලයන්ද දළ සේවා කාලය ගණනයේදී අදාළ කර ගත හැකි බවද සඳහන් වන බැවින් මෙම පුහුණු කාලය සීමාවාසික පුහුණු කාලයක් නොවුවද රැකියාවට අදාළ පුහුණු කාලයක් වන නිසා මොවුන්ගේ පුහුණු කාලය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා අදාළ කරගැනීමේ හැකියාව පිළිබඳවද සීපීසී/පීඑස්සී/15-18/පොදු ගොනුව/2019 හා 2019.11.13 දිනැති ලිපිය මඟින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසීම් කරන ලදී.

08. ඒ අනුව, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද අංක PEN/Pol/1A/DIR/D03 හා 2019.12.30 දින දරණ ලිපියෙන් ලද උපදෙස් පහත පරිදි දැක්වේ.

"විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 4 (ආ) 1 වන වගන්තිය අනුව, යම් තැනැත්තෙකු රජය යටතේ පුහුණු වීමේ හෝ පුරුදු කිරීමේ කාලයක් සම්පූර්ණ කළ පසු රජයේ නිලයකට හෝ තනතුරකට පත් කරනු ලැබ, අවසානයේ දී විශ්‍රාම වැටුප් හිමි නිලයකින් හෝ තනතුරකින් විශ්‍රාම ලද්දේ නම්, එම පුහුණු වීමේ හෝ පුරුදු කිරීමේ කාලය ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගත යුතුවේ.
ඒ අනුව මධ්‍යම පළාත් සභාවේ තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ පුහුණු සේවා කාලයට අදාළව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 2/2013 අනුව වැන්දඹු හා අනත් දරු දායක මුදල් අයකර විශ්‍රාම වැටුප් ගණනයට යොදා ගත හැකි බව දන්වා ඇත. "

09. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 2/2013 හා 9/2004 චක්‍රලේඛ අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලද පසු ආරම්භක වැටුප් පදනම් කරගෙන අයකළ යුතු බවත්, එම පුහුණු සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කරන අවස්ථාවේදී සේවා කාලය සඳහා 'අ'/'ඇ' ආකෘති සම්පූර්ණ කිරීමේදී විශ්‍රාම වැටුප සඳහා ගණන් ගතයුතු බවත් සඳහන් වේ.

10. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST 5/4/24(XXIV)-5 හා 2019.10.24 දින දරණ ලිපියෙන් ලද උපදෙස් අනුව පුහුණු ශ්‍රේණියට බඳවාගෙන ඇති කාර්මික නිලධාරීන්ගේ පුහුණුවීම් කාලය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ගණනීය සේවා කාලයක් ලෙස සලකන්නේ නම් පමණක් එම නිලධරයන් සඳහා ජීවන වියදම් දීමනාව ගෙවිය හැකි බව සඳහන් කර ඇති බැවින් මෙම නිලධාරීන් සඳහා පුහුණු කාලය තුළ ජීවන වියදම් දීමනාව ගෙවීම ගරු කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

11. ඒ අනුව, මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ පුහුණු තනතුර සඳහා පත්වීම් ලද නිලධාරීන්ගේ මෙම පුහුණු සේවා කාලය විශ්‍රාම ගන්වන අවස්ථාවේදී සේවා කාලය ලෙස අදාළ කර ගන්නා අවස්ථාවලදී වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකර ගත හැකි බව සහ එම පුහුණු කාලය තුළ ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සිදු කරන ලෙස කාරුණිකව දන්වමි.

එම්.ජී.ඒ.තිලකරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත් -

01. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත. - දැ.ගැ.පි.
02. ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත. - දැ.ගැ.පි.
03. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත. - දැ.ගැ.පි.
04. පළාත් අධ්‍යක්ෂ, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත. - දැ.ගැ.පි.